**සීමාසහිත ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව - 2021**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

සීමාසහිත ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුවේ (“බැංකුව”) 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

බැංකුවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී, බැංකුව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා බැංකුවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

බැංකුවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, බැංකුවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය

හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, හා ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් බැංකුවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබා ගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා බැංකුවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ බැංකුවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ බැංකුවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, බැංකුව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

### 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම පිළිබඳ විගණන නිරීක්ෂණ

### 1.5.1 අවිනිශ්චිත ගිණුම්

<table>
<tr><th>විගණන නිරීක්ෂණය</th><th>කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම</th><th>නිර්දේශය</th></tr>
<tr><td>i. හඳුනා නොගත් රු. 258,700 ක ශේෂයක් " ප්‍රමුඛ ඉතිරි කිරීමේ සහ සංවර්ධන බැංකුවේ (PSDB) ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු තැන්පතු" (ආන්තික) ගිණුමට ඇතුළත් කර තිබුණි.</td><td>2021.12.31 දිනට පොදු ලෙජර ශේෂයට අනුව, ප්‍රමුඛ ඉතිරි කිරීමේ සහ සංවර්ධන බැංකුවේ (PSDB) අයකර ගැනීම් ආන්තික ගිණුම රු.26,061,777.20 ක මුළු මුදලක් දක්වයි. එයින් රු.258,700/- ක මුදලක් හඳුනාගෙන නොමැති අතර එම මුදල “ප්‍රමුඛ ඉතිරි කිරීමේ සහ සංවර්ධන බැංකුව (PSDB) ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු තැන්පතු" ආන්තික ගිණුමට ඇතුළත් කර තිබුණි.<br>එකඟ වන අතර 2022 වර්ෂයේ දී නිවැරදි කරනු ලැබේ.</td><td>ශේෂ හඳුනාගැනීමේ ක්‍රියාවලිය ශක්තිමත් කළ යුතුය.</td></tr>
<tr><td>ii. පහත දක්වා ඇති හඳුනා නොගත් ශේෂ නිරවුල් නොකර වෙනත් වගකීම් යටතේ දක්වා තිබුණි.
<table>
<tr><th>විෂය</th><th>මුදල (රු.)</th></tr>
<tr><td>හඳුනා නොගත් බැංකු තැන්පතු</td><td>4,634,371</td></tr>
<tr><td>අවිනිශ්චිත ගිණුම් නිෂ්කාශනය</td><td>1,980,686</td></tr>
<tr><td>අත්තිකාරම් ණය</td><td>185,200</td></tr>
<tr><td>ණය ඉතුරුම් සඳහා පාලන ගිණුම</td><td>814,694</td></tr>
</table></td><td>1.කිසිදු පාරිභෝගික හැඳුනුම්පත් අංකයක් හෝ යොමු අංකයක් නොමැතිව ගනුදෙනුකරුවන් විසින් මහජන බැංකුවේ සෘජුව තැන්පත් කරන ලද මුදල්.<br><br>ගනුදෙනුකරුවන් හඳුනා ගැනීමට හැකි සෑම උත්සාහයක්ම දරා ඇත. කෙසේ වුවද, ඔවුන් හඳුනා ගැනීමට අපට නොහැකි විය. එම මුදල් අවිනිශ්චිත ගිණුමට (හඳුනා නොගත් බැංකු තැන්පතු) මාරු කර ඇත.<br>2. එකඟ වෙමි. 2022 වර්ෂයේ දී මෙම ගැටලුව නිවැරදි කිරීමට අප විසින් සටහන් කර ගන්නා ලදී.<br>3. එකඟ වෙමි. 2022 වර්ෂයේ දී මෙම ගැටලුව නිවැරදි කිරීමට අප විසින් සටහන් කර ගන්නා ලදී.<br>4. මෙය ස්වයංක්‍රීය ගිණුමකි. එබැවින්, මෙය පද්ධති සැපයුම්කරු වෙත, එනම් Scienter වෙත වාර්තා කර ඇත. 2022 වර්ෂයේදී ගැටළුව නිවැරදි කිරීමට සටහන් කර ගන්නා ලදී.</td><td>ශේෂ හඳුනාගැනීමේ ක්‍රියාවලිය ශක්තිමත් කළ යුතුය.</td></tr>
</table>

### 1.5.2 සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂකගේ 2021 ජනවාරි 05 දිනැති අංක: 02/19/319/0001/004 දරන ලිපියට අනුව, 2021 සැප්තැම්බර් 30 වන විට බැංකුව ඈවර කිරීමට හෝ ජාතික ඉතිරිකිරීමේ බැංකුව (NSB) සමඟ ඒකාබද්ධ කිරීමට නියමිතය. එදින සිට ක්‍රියාත්මක වන පරිදි, බැංකුවේ මෙහෙයුම් කටයුතු අත්හිටුවා තිබුණු අතර ණය ගෙවීම් සිදු නොකරන ලද අතර අලුතින් තැන්පතු ලබා ගැනීම ද සිදු කර නොතිබුණි. කෙසේ වුවද, මෙම වාර්තා කරන දිනය දක්වා බැංකුව ඈවර කර හෝ ජාතික ඉතිරිකිරීමේ බැංකුව (NSB) සමඟ ඒකාබද්ධ කර හෝ නොතිබුණි. | ඒකාබද්ධ කිරීම සම්බන්ධ ඉදිරි කටයුතු සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ සහ මුදල් අමාත්‍යාංශයේ උපදෙස් ලබා ගැනීමට අපේක්ෂා කරන බව ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ (NSB) කළමනාකාරීත්වය විසින් දැනුම් දෙන ලදී. මහා භාණ්ඩාගාරය මගින් ඒකාබද්ධ කිරීම සඳහා අනුමැතිය ලබා දීමෙන් අනතුරුව පමණක් නීති උපදෙස් ලබා දිය හැකි බව නීතිපති දෙපාර්තමේන්තුව මගින් ඔවුන්ගේ 2022.09.09 දිනැති ලිපියෙන් දැනුම් දී ඇත.<br>ඒ අනුව, ඒකාබද්ධ කිරීම සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය නියෝගයක් ලබා ගැනීමේ අපේක්ෂාවෙන් ජාතික ඉතිරිකිරීමේ බැංකුව (NSB) මගින් මෙම කරුණ 2022.09.21 දිනැති ලිපිය මගින් භාණ්ඩාගාර ලේකම් වෙත යොමු කර ඇති අතර, ඔවුන්ගේ තීරණය මෙතෙක් ලැබී නොමැත. | ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලිය අවසන් කිරීමට ක්ෂණික ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| i. භානිකරණය ගණනය කිරීම සඳහා සලකා බැලූ ණය ශේෂ සහ පොදු ලෙජරයේ ණය ශේෂ අතර පහත දැක්වෙන වෙනස්කම් නිරීක්ෂණය විය. භානිකරණය ගණනය කිරීම සඳහා බැංකුව විසින් පමාසහන පහසුකම්වල හිඟ පොළිය සලකා බලන ලදී. නමුත් 2021 වර්ෂය තුළ හිඟ පොළිය පොළී ආදායම ලෙස හඳුනාගෙන නොමැත. | එකඟ වෙමි. මේවා 2022 ජනවාරි මාසයේදී නිවැරදි කර ඇත. | මෙවැනි තත්ත්ව මඟහරවා ගැනීම සඳහා අභ්‍යන්තර පාලන ක්‍රියා පටිපාටිය ශක්තිමත් කළ යුතුය. |

| ණය වර්ගය | භානිකරණ ශේෂය (රු.) | පොදු ලෙජර ශේෂය (රු.) | වෙනස (රු.) |
|---|---|---|---|
| කල්බදු සහ කුලී පිට ගැණුම් | 277,020,202 | 276,606,259 | 413,943 |
| වෙනත් ණය | 542,475,218 | 527,580,956 | 14,894,262 |
| පුද්ගලික ණය | 184,442,603 | 184,228,695 | 213,908 |
| ප්‍රජා දිරිය | 14,630,938 | 14,630,685 | 253 |
| ක්ෂුද්‍ර මූල්‍ය ණය | 506,473,433 | 505,157,456 | 1,315,977 |

| | | |
|---|---|---|
| ii. "කලින් ගෙවූ වට්ටම්" නමැති ගිණුම යටතේ රු.13,376,694 ක ශේෂය සත්‍යාපනය කිරීම සඳහා සාක්ෂි ලැබී නොතිබුණි. | කලින් ගෙවන ලද වට්ටම් ප්‍රමුඛ ඉතිරි කිරීමේ සහ සංවර්ධන බැංකුව (PSDB) පැවරීමේ දී මාරු කර ඇත. එබැවින්, තහවුරු කිරීම සඳහා කිසිදු සාක්ෂියක් නොමැත. | මූලා ප්‍රකාශනවල සෑම ශේෂයක් සඳහාම සාක්ෂි සහ විස්තර පවත්වා ගත යුතුය. |
| iii. හිමිකරුගේ (NSB) ලිපිය මත පදනම්ව මාතර ශාඛාව පිහිටුවා ඇති ගොඩනැගිල්ල සඳහා රු. 3,800,000 (200,000*19) මුදලක් කුලිය ලෙස උපචිත වී තිබුණි. කෙසේ වුවද, බැංකුව මේ සම්බන්ධයෙන් ජාතික ඉතිරි කිරීමේ බැංකුව (NSB) සමඟ කුලී ගිවිසුමකට එළැඹ නොතිබුණි. | ගෙවිය යුතු මාසික කුලිය සම්බන්ධයෙන් මව් සමාගම වන ජාතික ඉතිරි කිරීමේ බැංකුව (NSB) සමඟ සාකච්ඡා පවත්වනු ලබයි. ගොඩනැගිල්ල කුලියට දීම සම්බන්ධයෙන් ජාතික ඉතිරි කිරීමේ බැංකුව (NSB) සමඟ ගිවිසුමකට එළඹීමට කටයුතු කරනු ඇත. | කුලිය සඳහා මුදලක් ලබා දීමට පෙර බැංකුව ගිවිසුමකට එළඹිය යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| i. ඉකුත් වර්ෂවල සිට පවතින හිඟ මුදල වූ රු. 48,498 ක් වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම ගැටළුව සටහන් කර ගන්නා ලද අතර 2022 වර්ෂයේ දී නිවැරදි කරනු ඇත. | මෙවැනි තත්ත්ව මඟ හරවා ගැනීම සඳහා අභ්‍යන්තර පාලන ක්‍රියා පටිපාටිය ශක්තිමත් කළ යුතුය. |
| ii. පහත දක්වා ඇති ලැබිය යුතු මුදල් වර්ෂ කිහිපයක සිට අයකර ගැනීමකින් තොරව හිඟව පැවතුණි. | 1. මුද්දර ගාස්තු මුදල යනු ණය ගෙවීම පැහැර හරින ලද ගනුදෙනුකරුවකු (Visterin Road දේපල) ගේ උකස් කළ දේපළ බැංකුව විසින් අත්පත් කර ගැනීමේදී ගෙවනු ලබන මුදලකි. දේපළ වෙන්දේසියේදී, යම් ලංසුකරුවෙකු විසින් ප්‍රතිචාර නොදැක්වුවහොත්, බැංකුව විසින් දේපළ ලබා ගත යුතු වේ. එම | උකස් දේපළ අත්පත් කර ගැනීම් නිවැරදිව ගිණුම්ගත කළ යුතු අතර ලැබිය යුතු ශේෂ නිෂ්කාශනය කිරීමට හෝ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

| විෂයය | මුදල (රු.) |
|---|---|
| ලැබිය යුතු මුද්දර ගාස්තු | 1,999,000 |
| විවිධ ණය ගැතියන් | 21,261 |
| ලැබිය යුතු කාර්ය මණ්ඩල ප්‍රසාද දීමනා අත්තිකාරම් | 20,000 |

| | | |
|---|---|---|
| | අවස්ථාවේදී, බැංකුව විසින් ලැබිය යුතු මුද්දර ගාස්තු ගෙවිය යුතු වේ.<br>2. විවිධ ණයගැතියන්: සටහන් කර ගන්නා ලද අතර 2022 වර්ෂයේදී ගැටලුව නිවැරදි කරනු ඇත. | |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| i. වර්ෂය අවසානයේ දී පහත දැක්වෙන අනෙකුත් වගකීම් ශේෂ නිෂ්කාශනය කිරීමකින් තොරව වසරකට වැඩි කාලයක් හිඟව පැවතුණි.<br><br>**විෂය** — **මුදල (රු.)**<br>බදු දඩ — 171,888,403<br>දෝෂ නිවැරදි කිරීමේ ඉතිරුම් — 1,975,871<br>කල් පිරෙන ප්‍රාග්ධන අවිනිශ්චිත ගිණුම - ස්ථාවර තැන්පතු (FD) — 267,853<br>ලැබිය යුතු මුදල් - කාර්ය මණ්ඩලය — 181,070<br>ණය සුරැකුම් අරමුදල - ප්‍රජා දිරිය — 67,350 | 1. බදු දඩ: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මගින් 2022.06.30 දින රු. මිලියන 91 ක් අත්හැර දමන ලද අතර ඉතිරිය රු. මිලියන 79.9 කි. මෙම ශේෂය ද අත්හැරීමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව එකඟ වී ඇත.<br>2.ලැබිය යුතු මුදල් - කාර්ය මණ්ඩලය: එකඟ වෙමි. දෝෂ 2022 වර්ෂයේදී නිවැරදි කරනු ලැබේ.<br>3.එකඟ වෙමි. දෝෂ 2022 වර්ෂයේදී නිවැරදි කරනු ලැබේ.<br>4. ණය සුරැකුම් අරමුදල - ප්‍රජා දිරිය: අවදානම අවම කිරීම සඳහා පාරිභෝගිකයින්ගෙන් ගාස්තුවක් අය කර ඇත. | හිඟ ශේෂ සාධාරණ කාලසීමාවක් තුළ සැසඳීම සිදු කර නිෂ්කාශනය කළ යුතුය. |
| ii. පහත දැක්වෙන අසාමාන්‍ය ඍණ ශේෂ 2021 වර්ෂය අවසානයේ දී ගෙවිය යුතු මුදල් යටතේ ඇතුළත් කර තිබුණි.<br><br>**විෂය** — **මුදල (රු.)**<br>චෙක්පත් පාලන ගිණුම — 2,673,801<br>ඉතුරුම් ස්ථාවර නියෝග පාලන ගිණුම — 48,310 | 1. චෙක්පත් පාලන ගිණුමේ ශේෂය වූ රු. 2,673,801 සහ රු. 1,980,686 ක් වූ අවිනිශ්චිත ගිණුම නිෂ්කාශනය කිරීම (1.4.3 (ii) අයිතමය යටතේ) මගින් රු.693,115/- ක වෙනසක් ජනනය කරයි. මෙය අප විසින් 2022 වර්ෂයේදී සැසඳීමට අපේක්ෂා කරන්නෙමු.<br>3.ඉතුරුම් ස්ථාවර නියෝග පාලන ගිණුම දැනටමත් නිවැරදි කර ඇත. | බැංකුව විසින් මෙම අසාමාන්‍ය ශේෂ නිරවුල් කළ යුතුය. |

**1.7 මුදල් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශවලට අනුව, මාස 01 සිට වර්ෂ 06 දක්වා කාල පරාසයක් තුළ යම් බැර සහ හර ශේෂ නිෂ්කාශනය නොවී පැවතුණි.<br><br>**විස්තරය** — **මුදල (රු.)**<br>----------- — ------------<br>සෘජු තැන්පතු (බැර) — 409,797<br>හඳුනා නොගත් තැන්පතු (බැර) — 614,406<br>සේවා ගාස්තු (හර) — 1000<br>ශේෂය තහවුරු කිරීම (හර) — 500<br>ලැබීම් මාරු (හර) — 13500<br>කවුන්ටර මුදල් නිවැරදි කිරීම (හර) — 2000<br>දෝෂ දැක්වීම (හර) — 78,880 | • සේවා ගාස්තු සහ ශේෂ සනාථන නිවැරදි කර ඇත. සෘජු තැන්පතු සහ හඳුනා නොගත් තැන්පතු නිසි හඳුනා ගැනීමකින් තොරව නිෂ්කාශනය කළ නොහැක: ඔවුන් හඳුනා ගැනීමට අපි සෑම උත්සාහයක්ම දරන්නෙමු.<br>• කවුන්ටර මුදල් නිවැරදි කිරීම සහ දෝෂ දැක්වීම නිවැරදි කරනු ලැබේ. | මෙවැනි තත්ත්ව මඟ හරවා ගැනීම සඳහා අභ්‍යන්තර පාලන ක්‍රියා පටිපාටිය ශක්තිමත් කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු 255,144,487 ක ලාභයක් වූ අතර ඉකුත් වර්ෂයේ එයට අනුරූප ලාභය රු. 275,056,231 ක් විය. එබැවින් මූල්‍ය ප්‍රතිඵලයේ රු.19,911,744 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ප්‍රධාන හේතු වූයේ බැංකුවේ ක්‍රියාකාරීත්වය අත්හිටුවා තිබීම හේතුවෙන් පොළී ආදායම රු. 187,149,387 කින් හෙවත් සියයට 24 කින් අඩුවීම සහ ගාස්තු හා කොමිස් ආදායම රු. 2,003,931 කින් හෝ සියයට 48 කින් අඩුවීම සහ අනෙකුත් මෙහෙයුම් ආදායම රු. 8,356,389 කින් හෙවත් සියයට 10 කින් අඩුවීමය.

**2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය**

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් සහ වියදම් අයිතම විශ්ලේෂණය ඉකුත් වර්ෂය හා සැසඳීමේ දී වැඩිවීමේ හෝ අඩුවීමේ ප්‍රතිශත සමඟ පහත දක්වා ඇත.

| විස්තරය | විචලනය (රු.) | විචලනය % | විචලනය සඳහා හේතු |
|---|---|---|---|
| පොළී ආදායම | (187,149,387) | (24) | 2021 ජනවාරි 05 වැනි දින ශ්‍රී ලංකා මහ බැංකුව මගින් මෙහෙයුම් කටයුතු අත්හිටුවීම හේතුවෙන් වර්ෂය තුළ ආයෝජන සඳහා පොළී අනුපාතය අඩු කර තිබුණු අතර විය පැහැදම් ගෙවීම් ද සිදු කර නොතිබුණි. |
| පොළී ආදායම | (20,366,904) | (27) | බොහෝ ගනුදෙනුකරුවන් තම තැන්පතු මුදල් ආපසු ලබාගෙන තිබුණු අතර පොළී අනුපාතය ද අඩු කර ඇත. 2021 ජනවාරි 5 වැනි දින මහ බැංකුව විසින් වැඩිදුර මෙහෙයුම් කටයුතු අත්හිටුවා ඇත. |

| | | | |
|---|---|---|---|
| ගාස්තු සහ කොමිස් ආදායම | (2,003,931) | (48) | 2021 ජනවාරි 5 වැනි දින ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මෙහෙයුම් කටයුතු අත්හිටුවීම හේතුවෙන් ණය ලබා දී නොතිබුණු බැවින්, සැකසුම් ගාස්තු වැනි ණය ගැනුම්කරුවන්ගෙන් අය කරන ලද අදාළ ආදායම ජනනය වී නොතිබුණි. |
| ගාස්තු සහ කොමිස් ආදායම | (222,044) | (82) | 2021 ජනවාරි 5 වැනි දින ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මෙහෙයුම් කටයුතු අත්හිටුවීම හේතුවෙන් ණය ලබා දී නොතිබුණු බැවින්, CRIB ගාස්තු වැනි ණය සැකසුම් සඳහා අදාළ පිරිවැය ජනනය වී නොතිබුණි. |
| ක්ෂය කිරීම් සහ ක්‍රමක්ෂ වියදම් | (1,870,348) | (17) | ප්‍රධාන කාර්යාලයේ බදු ගිවිසුම සමාලෝචිත වර්ෂයේදී කල් ඉකුත් වීම හේතුවෙන් එම ගිවිසුම වසරක කාලයක් සඳහා පමණක් අලුත් කරන ලදී. |
| ආදායම් බදු වියදම් | (65,198,381) | (46) | 2020 වර්ෂයේදී බැංකුව විසින් සියයට 28ක සහ 2021 වර්ෂයේදී සියයට 24ක අනුපාතයකින් ආදායම් බදු සඳහා ප්‍රතිපාදන සලසා තිබුණි. |
| හානිකරණය | (135,256,679) | (228) | මෙහෙයුම් කටයුතු අත්හිටුවීම හේතුවෙන් බොහෝ ණය අවසන් කරන ලද අතර කිසිදු විය පැහැදම් ගෙවීමක් ද සිදු නොකළ අතර 2021 වර්ෂය තුළ ණය අයකර ගැනීම පමණක් සිදු කර ඇත. |

## 2.3 අනුපාත විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා බැංකුවේ ඇතැම් වැදගත් අනුපාත පහත දැක්වේ.

| **විස්තරය** | **ආංශික අනුපාත* (%)** | **සීමාසහිත ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව** | |
|---|---|---|---|
| | | **2021 (%)** | **2020 (%)** |
| **ලාභදායිතා අනුපාත** | | | |
| ස්කන්ධ මත ප්‍රතිලාභ (ROE) | 21.5 | 5 | 4.8 |
| වත්කම් මත ප්‍රතිලාභ (ROA) | 1.7 | 5 | 4.62 |
| ශුද්ධ පොළී ආන්තිකය | 4.1 | 10 | 7.94 |
| **වත්කම්වල ගුණාත්මකතා අනුපාතය** | | | |
| දළ අක්‍රිය ණය අනුපාතය | 6.5 | 22.81 | 20.73 |
| **ද්‍රවශීලතාව** | | | |
| ද්‍රවශිලතා වත්කම් අනුපාතය | 52.8 | 742 | 511.32 |
| **ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාත** | | | |
| ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාව - ස්ථර 1 (අවම වශයෙන් සියයට 5) | | 101 | 82.04 |

***** ආංශික අනුපාත ශ්‍රී ලංකා මහ බැංකුව මගින් ප්‍රකාශයට පත් කරන ලද තොරතුරුවලින් උපුටා ගන්නා ලදී.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| i. බැංකුව මගින් නිසි පරිදි ක්‍රියාකාරකම් විභජනයක් සිදු කර නොතිබුණි. උදා: මූල්‍ය අංශයේ කාර්ය මණ්ඩලය කුලී පිට ගැණුම් සහ කල්බදු කටයුතු ද සිදු කරයි. | ජ්‍යෙෂ්ඨ කළමනාකරු- මූල්‍ය සහ සැලසුම් කල්බදු ප්‍රධානියා ලෙස ද වැඩ බැලීමේ කටයුතු සිදු කරයි. කෙසේ වුවද, ප්‍රමාණවත් වැඩ විභජනයක් පවතින අතර පාලන යාන්ත්‍රණ වැඩිදියුණු කර ඇත. | වංචනික ක්‍රියාකාරකම් සිදු වීම වැළැක්වීම සඳහා බැංකුව විසින් කාර්යයන් විභජනය කළ යුතුය. |
| ii. ලියාපදිංචි නොකළ, නවතම වාහනයක් මිලදී ගැනීම සඳහා බැංකුව විසින් 2021 ජනවාරි 13 වන දින මහ බැංකුවේ අනුමැතිය ලබාගෙන තිබුණි. කෙසේ වුවද, බැංකුව විසින් දෙවන හිමිකරු ලෙස රජයේ බලපත්‍ර ක්‍රමය යටතේ ආනයනය කරන ලද ලියාපදිංචි කරන ලද වාහනයක් මිලදී ගෙන තිබුණි. | බැංකුව විසින් කරන ලද ඉල්ලීමට අනුව, දැනටමත් මිලදී ගැනීමේ ඇණවුම නිකුත් කර තිබූ වාහනයට මුදල් ගෙවීමට මහ බැංකුව මගින් අනුමැතිය ලබා දී ඇත. මිලදී ගත් වාහනය අලුත්ම වාහනයකි. මේ බව අදාළ වාහන අලෙවි නියෝජිතවරයා වන, යුනයිටඩ් මෝටර්ස් විසින් තහවුරු කර ඇත. | මහ බැංකුවෙන් ලැබෙන මඟපෙන්වීමට අනුව බැංකුව කටයුතු කළ යුතුයි. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| i. ප්‍රමුඛ ඉතිරි කිරීමේ සහ සංවර්ධන බැංකුවේ (PSDB) පහත සඳහන් ආයෝජන අයකර ගැනීමට හෝ එම මුදල් සඳහා ප්‍රතිපාදන සැලසීමට කිසිදු ක්රියාමාර්ගයක් ගෙන නොතිබුණි.<br><br>**සමාගම** — **මුදල (රු.)**<br>සීමාසහිත පැරඩයිස් මෙටල් ක්‍රෂර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් — 6,000,000<br>වනික් ඉන්කෝපරේෂන් — 57,194,500<br>ෆෝබ්ස් — 30,000,000<br>හබිබ් බැංකුව — 78,400,000 | • පැරඩයිස් මෙටල් ක්‍රෂර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ සීමාසහිත වනික් ඉන්කෝපරේෂන් ලිමිටඩ් ඈවර කර ඇති අතර කිසිදු ලියවිල්ලක් අප සතුව නොමැත. මෙය ප්‍රමුඛ ඉතිරි කිරීමේ සහ සංවර්ධන බැංකුව (PSDB) ඒකාබද්ධ කිරීමේදී බැංකුව වෙත මාරු කර ඇත.<br>• ෆෝබ්ස් ද බංකොලොත් වීම මත ඈවර කරන ලදී. බැංකුව සතුව ලේඛන නොමැත.<br>• ප්‍රමුඛ ඉතිරි කිරීමේ සහ සංවර්ධන බැංකුව (PSDB) විසින් හබිබ් බැංකුව - CHC/132/2001/1 නඩුව පවරන ලදී. (පසුව සීමාසහිත ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව (SLSB) ආදේශ කරන ලදී). | ප්‍රමුඛ ඉතිරි කිරීමේ සහ සංවර්ධන බැංකුවේ (PSDB) ආයෝජන අයකර ගැනීමට බැංකුව මගින් පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| | තීන්දුව 2010.01.12 දින හබීබ් බැංකුවට පක්ෂව ලබා දී ඇත.<br>• සීමාසහිත ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව (SLSB) විසින් අභියාචනා නඩුවක් ගොනු කර ඇති අතර ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ තර්ක ඉදිරිපත් කර තිබුණි. තීන්දුව කල් තබන ලදී. නඩු අංකය: SC/CHC/Appeal/22/2010. | |
| i. එක් එක් කාණ්ඩය යටතේ පහත සඳහන් අක්‍රිය ණය දින 540 කට වඩා අධික කාලයක් මුළුල්ලේ හිඟව පැවතුණි.<br>i. | කොවිඩ් 19 වසංගතය මධ්‍යයේ පවා බැංකුව විසින් 2021 වර්ෂයේදී අක්‍රිය ණය කළඹ රු. මිලියන 146.2 කින් අඩු කර ඇත.<br>සියලුම අක්‍රිය ණය පහසුකම් සඳහා අය කිරීම් සම්බන්ධයෙන් සමීපව පසු විපරම් කටයුතු සිදු කෙරේ.<br>අක්‍රිය ණය කළඹ අඩු කිරීම සම්බන්ධයෙන් සටහන් කර ගන්නා ලදී. | බැංකුව මගින් නිසි අයකර ගැනීමේ ක්‍රියා පටිපාටි අනුගමනය කළ යුතුය. |

| **ණය වර්ගය** | **දින 540 ට වැඩි හිඟ මුදල් (රු.)** | **හිඟ මුදල් මුළු හිඟ මුදලේ ප්‍රතිශතයක් ලෙස (%)** |
|---|---|---|
| දොරෙන් දොරට | 2,719,118 | 64 |
| ස්වශක්ති | 2,014,284 | 89 |
| වාහන | 1,549,601 | 100 |
| තැනැත්තන්, දේපළ හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරියේ (REPPA) ණය | 43,029,655 | 100 |
| ප්‍රජා දිරිය | 13,331,457 | 91 |
| ක්ෂුද්‍ර මූල්‍ය සංවර්ධනය | 7,474,224 | 100 |
| ක්ෂුද්‍ර මූල්‍ය | 232,392,792 | 46 |

### 3.3 මානව සම්පත් කළමනාකරණය

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| i. 2021 දෙසැම්බර් 31 දිනට බැංකුවේ අනුමත සේවක සංඛ්‍යාව සහ තථ්‍ය සේවක සංඛ්‍යාව අනුපිළිවෙළින් 154 ක් සහ 105 ක් විය. එබැවින්, පුරප්පාඩු 49 ක් හෙවත් අනුමත සේවක සංඛ්‍යාවෙන් සියයට 32 ක පුරප්පාඩු පැවතුණි. එම පුරප්පාඩු ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 12 කින්, කනිෂ්ඨ මට්ටමේ තනතුරු 76 කින් | 2021 ජනවාරි 05 දිනැති ලිපියට අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලබා දී ඇති නියෝග පිළිපැදීම සඳහා බැංකුවේ පුරප්පාඩු වූ තනතුරු සඳහා කාර්ය මණ්ඩල බඳවා ගැනීම් සිදු කිරීම කළමනාකාරිත්වය විසින් අත්හිටුවා ඇත. | බැංකු කටයුතු සිදුකිරීමට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් බැංකුව සතු විය යුතුය. |

| | | |
|---|---|---|
| සහ ප්‍රාථමික මට්ටමේ තනතුරු 17 කින් සමන්විත විය. ප්‍රධාන කළමනාකරු, ජ්‍යෙෂ්ඨ කළමනාකරු, කළමනාකරු, ශාඛා කළමණාකරුවන් වැනි ප්‍රධාන තනතුරුවල පුරප්පාඩු පැවති බව නිරීක්ෂණය විය. | | |
| ii. 2020 සැප්තැම්බර් 01 වන දින ලඝුලේඛක - III තනතුර සඳහා සේවකයින් දෙදෙනෙකු උසස් කරනු ලැබුවද, අනුමත සේවක සංඛ්‍යාව තුළ එම තනතුර නොපවතී. | ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ (NSB) ව්‍යුහයට අනුකූල වන පරිදි, ඔවුන්ව ලඝුලේඛක III ශ්‍රේණියේ ස්ථානගත කිරීම සඳහා 2019 දෙසැම්බර් 18 වන දින පැවති ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ (NSB) සාමාන්‍යාධිකාරි / ප්‍රධාන විධායක නිලධාරියාගේ ප්‍රධානත්වයෙන් පැවති විධායක මානව සම්පත් කමිටු රැස්වීමේ දී මෙම තීරණය ගන්නා ලදී. ඒකාබද්ධ කිරීම හේතුවෙන් ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ (NSB) කාර්ය මණ්ඩල තනතුරු සඳහා සීමාසහිත ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුවේ **(**SLSB**)** කාර්ය මණ්ඩලය ස්ථානගත කිරීම සඳහා ජාතික ඉතිරි කිරීමේ බැංකුවට (NSB) සමාන වන පරිදි, සීමාසහිත ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුවේ **(**SLSB**)** ව්‍යුහය සංශෝධනය කිරීමට තීරණය විය. | බැංකුව විසින් බැංකුවේ අනුමත සේවක සංඛ්‍යාව තුළ බඳවා ගැනීම් හෝ උසස් කිරීම් සිදු කළ යුතුය. |
| iii. රාජ්‍ය ව්‍යාපාර (PED) චක්‍රලේඛ අංක: 03/2015 අනුව, ආයතන එකකට වඩා වැඩි සංඛ්‍යාවක සභාපති තනතුරු දරන පුද්ගලයකු විසින් පහත දැක්වෙන පරිදි දීමනා ලබා ගනු ලබයි;<br><br>1 වන කාර්යාලය සම්පූර්ණ දීමනාව<br>2 වන කාර්යාලය 50% දීමනාව<br>3 වන කාර්යාලය 25% දීමනාව<br>2020 පෙබරවාරි 05 වන දින මෙම සභාපතිවරයා බැංකුවේ සභාපතිවරයා ලෙස පත් කරන ලද අතර එය සභාපතිවරයාගේ තුන්වන කාර්යාලය විය. එබැවින්, සභාපතිවරයාගේ හිමිකම මාසික දීමනාවෙන් සියයට 25 ක්, එනම් මසකට රු. 20,000 (80,000*25%) වේ. කෙසේ වුවද, බැංකුව විසින් සමාලෝචිත වර්ෂය අවසන් වන තෙක් මාස 22 ක් සඳහා සභාපතිවරයා වෙත රු. 40,000 ක මාසික දීමනාවක් ගෙවා ඇත. මේ අනුව, බැංකුව මගින් රු. 440,000 ක් වැඩිපුර ගෙවා තිබුණි. | එකී රාජ්‍ය ව්‍යාපාර (PED) චක්‍රලේඛයට අනුව, සීමාසහිත ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුවේ **(**SLSB**)** මව් සමාගම වන ජාතික ඉතිරි කිරීමේ බැංකුව (NSB) පළමු කාර්යාලය වශයෙන් සම්පූර්ණ දීමනාව ගෙවනු ලබන අතර ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ (NSB) පරිපාලිතය වන සීමාසහිත ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව **(**SLSB**)** මගින් “දෙවන කාර්යාලය වශයෙන් දීමනාවෙන් 50% ක්” ගෙවනු ලබන අතර ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ (NSB) පරිපාලිතයක් වන සීමාසහිත එන්එස්බී අරමුදල් කළමනාකරණ සමාගම තෙවන කාර්යාලය වශයෙන් 25% ක් ගෙවයි. | බැංකුව මහා භාණ්ඩාගාර චක්‍රලේඛවලට අනුකූලව කටයුතු කළ යුතුය. |